# චන්ද්‍රිකා හා ශ්‍රී. ල. නි. ප

ආරක්ෂක ඇමැති මාරපන මහතාට විරුද්ධව ගෙන ආ විශ්වාසභංග යෝජනාව පරාජයට පත්විය. එය බලාපොරොත්තු නොවූනක් නොවේ. එහෙත් ප්‍රශ්නය එය නොවේ. ඒ විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවට පමණක් සීමා වීමය. විශ්වාසභංග යෝජනාව සමග කළ යුතුව තිබූ වැඩ රාශියක් විරුද්ධ පක්ෂය නොකෙළේය. සාමාන්‍ය ජනතාව එවැනි විශ්වාස භංග යෝජනාවක් ගෙන එන බව පුවත්පතින් හැරෙන්නට වෙනත් ආකාරයකින් නොදැක්කෝය. මේ දිනවල පවත්නා ලෝක ක්‍රිකට් කුසලාන සැණකෙළිය හේතුකොටගෙන බොහෝ දෙනා ජීවත් වන්නේ වෙනත්ම ලෝකයක බව සැබැය. අද ගැස් මිල ඉහළ ගියත් දුම්රිය හෙමින් ධාවනය වුවත් බොහෝ දෙනකුට එය නොතේරෙයි. දුම්රිය හෙමින් ධාවනය වන බැවින් ක්‍රිකට් ගැන කතා කිරීමට තිබෙන කාලය වැඩි වීමක් නම් සිදු වෙයි. කෙසේ වෙතත් ශ්‍රී. ල. නි. ප පක්ෂයටත් පොදුවේ විපක්ෂයටත් පහර දිය යුත්තේ කාටද කෙසේද යන්න ගැන කිසිම අවබෝධයක් ඇති බවක් නොපෙනෙයි. මාරපන මහතාට විරුද්ධව ගෙන ආ විශ්වාසභංග යෝජනාව සමග ජනතාව අතරට යැමේ කිසිම පිළිවෙලක් ශ්‍රී. ල. නි. පක්ෂයටවත් පොදුවේ විපක්ෂයටවත් නොවීය. ශ්‍රී . ල. නි. ප තම කාර්යයන් හරිහැටි ඉටු නොකරන බව පැහැදිලිය.

ආණ්ඩුවට විරුද්ධව සටන පාර්ලිමේන්තුවට පමණක් සීමා කිරීමෙන් කළ හැකි දෙයක් නැත. සැමදාමත් පරදින විශ්වාසභංග යෝජනා හා වෙනත් යෝජනා පාර්ලිමේන්තුවට ගෙන ඒමෙන් පමණක් විපක්ෂය බලාපොරොත්තු වන්නේ කුමක්ද? මේ යෝජනා පාර්ලිමේන්තුවේ විවාද කෙරෙන අතර එය පාර්ලිමේන්තුවෙන් පිටතට ගෙන යැමටද වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. පසුගියදා මහින්ද රාජපක්ෂ මහතා ජන ඝෝෂාවක් සංවිධානය කර තිබුණි. ක්‍රිකට් සැණකෙළිය අස්සේ සංවිධානය කර තිබු මේ ජන ඝෝෂාව තුළින් දෙමළ ජාතිවාදය හා කොටි ත්‍රස්තවාදය යටපත් කර තිබුණි. ජන ඝෝෂාවෙන් කෙරුණේ රටේ ප්‍රධාන ප්‍රශ්නය ජනතාවගෙන් වසං කිරීමය. මෙවැනි ඝෝෂා කිහිප අර්ථයකින්ම බිහිරි අලි ඉදිරියේ කෙරෙන වීණා වැයීමකි. ඒවා ජනතාවටවත් ආණ්ඩුවටවත් නොඇසෙයි.

ආරක්ෂක අමාත්‍යාංශය අද ඇත්තේ රට ආරක්ෂා කිරීමට නොව කොටි සංවිධානය ආරක්ෂා කිරීමටය. නෝර්වේ රාජ්‍යයෙහි මැදිහත් වීමෙන් අත්සන් කරන ලද ඊනියා අවබෝධතා ගිවිසුම හෙවත් පාවා දීමේ ගිවිසුම කොටි නිරන්තරයෙන් කඩති. අවුරුද්දක් මේ ගිවිසුම පැවතුණා යැයි ආණ්ඩුව උදම් අනයි. එහෙත් ඒ ගිවිසුම පැවතී ඇත්තේ ගණිකාවකගේ පතිවත මෙනි. කොටි මේ දේශද්‍රෝහී ගිවිසුම කඩන කඩන වාරයක් පාසා ආණ්ඩුව නිවටව කොටි ඉදිරියේ වැඳ වැටීමෙන් පමණක් ගිවිසුම නොකැඩී ඇති බවක් කීමට ආණ්ඩුවේ වන්දිභට්ටයන්ට අවස්ථාව උදා වී ඇත. ඊනියා ජාතික සාම මණ්ඩලය නමින් ක්‍රිස්තියානි සභාවන් මගින් පවත්වා ගෙන යන සිංහල බෞද්ධ විරෝධී සංවිධානයක් මෙරට ජනතාවගෙන් 95% ක් ඊනියා සාම ගිවිසුමට පක්ෂ බව ප්‍රකාශ කර ඇත. මොවුන් මේ සංඛ්‍යාලේඛන ලබාගැනීම සඳහා සමීක්ෂණ කෙළේ කවදා ද? කෙසේද? 1505 සිට ම මෙරට සිංහල බෞද්ධයනට විරුද්ධව කටයුතු කරන ඇතැම් ක්‍රිස්තියානි හා කතෝලික සංවිධාන එම වැයම අත්හරින පාටක් නැත. දෙමළ ජාතිවාදය පිටුපස ඇත්තේ ක්‍රිස්තියානි බලවේගය බව මේ ප්‍රකාශ වලින් තවත් තහවුරු වෙයි. මේ සම්බන්ධයෙන් එවැනි ක්‍රිස්තියානි සංවිධාන සමග ඕනෑම ආකාරයක විවාදයකට එළඹීමට අපි සූදානමින් සිටිමු. කොටි ගිවිසුම කඩන අවස්තාවලදී කොටි ආරක්ෂා කරන අන්දමට පුවත්පත් නිවේදන නිකුත් කිරීම ආරක්ෂක අමත්‍යංශයේ කාර්යභාරය වී ඇත. පසුගියදා ආයුධ ගෙන යන නැවක් නාවික හමුදාවට අසුවූ අවස්ථාවේදීද වෙන කාටත් වඩා ආරක්ෂක අමාත්‍යංශය කොටි වෙනුවෙන් පෙනී සිටියේය. ගෙවී යන සතියේ හමුදා භටයකු කොටි විසින් ඝාතනය කරනු ලැබීමෙන් පසු පැවැත් වූ අවමගුලෙහිදී ඒ භටයාගේ මෘත ශරීරයට හමුදා ඇඳුම් ඇන්දවීමට ආරක්ෂක අමාත්‍යංශය ඉඩ නොදුන්නා පමණක් නොව, ඒ අවමංගල්‍ය සාමාන්‍ය හමුදා චාරිත්‍ර අනුව සිදු කිරීම ද තහනම් කළේය. මේ ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම්වලින් බිඳක් පමණකි. අද ජනාධිපතිනිය යටතට ආරක්ෂක අමාත්‍යංශය පමණක් නොව මුළු ආණ්ඩුවම ගත යුතුය. මේ විජාතික ආණ්ඩුව වෙනුවට විකල්ප ආණ්ඩුවක් පිහිටුවා රට ජාතිය බේරා ගැනීම අද දවසේ ප්‍රධාන කාර්යය වී ඇත.

අප බොහෝ අවස්ථාවලදී කියා ඇති ආකාරයට අද මෙරට දේශපාලනයෙහි ඊනියා පංති භේදයක් ඇත්තේ නැත. කාල් මාක්ස් හා මාක්ස්වාදය යනු කුමක්දැයි පැහැදිලි කරමින් මේ විජාතික ආණ්ඩුව ආරක්ෂා කිරීමට අද පෙරට

© Prof. Nalin De Silva

ඇවිත් ඇත්තේ ට්‍රොට්ස්කිවාදී නිවුන් සහෝදරයන් වන වාසු - බාහු දෙපළය. මෙයින් අදහස් කරන්නේ ඔවුන් හෝ ඊනියා කම්කරු පංතිය හෝ ආණ්ඩුව ආරක්‍ෂා කිරීමට තරම් ශක්තිමත් බව නොවේ. වික්‍රමබාහු කරුණාරත්න මහතා නම් සිතා සිටින්නේ කම්කරු පංතිය යනුවෙන් මහා බලයක් ඇති බවත් ඒ විසින් ප්‍රභාකරන්ටද වඩා හොඳින් දෙමළ ජනතාවට ඇතැයි කියන ප්‍රශ්න වෙනුවෙන් සටන් වදිනු ලබන බවත්ය. වික්‍රමබාහු කරුණාරත්න මහතාට මට රැකියාව ලැබුණේ කෙසේද යන්න සිට වෙනත් ඕනෑම කරුණක් ගැන ඕනෑම දෙයක් අසංගතව හෝ සිතා ගැනීමට තහනමක් නැත.

කොළඹ විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු උසාවියේ මා විසින් පවරනු ලැබූ නඩුව අවසන් වනතෙක් මේ සම්බන්ධයෙන් කිවයුතු දෑ බොහොමයක් කිව නොහැකිය. එහෙත් එක් කරුණක් පමණක් සඳහන් කරනු කැමැත්තෙමි. කැලණිය විශ්වවිද්‍යාලයේ මට රැකියාවක් ලැබී ඇත්තේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් අස්කිරීම වෙනුවට නොවේ. එය වෙනත්ම පත්වීමකි. මට කැලණිය විශ්වවිද්‍යාලයේ රැකියාවක් ලැබුනේ 1995-1996 වසරවල විශ්වවිද්‍යාල හතරකට යවන ලද ඉල්ලුම්පත් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 1999 නොවැම්බර් මස දුන් තීන්දුවකට යටත්ව බවත් විවෘත විශ්වවිද්‍යාලය හා රුහුණු විශ්වවිද්‍යාලය ඒ ඉල්ලුම් පත් සම්බන්ධයෙන් තවමත් කල්මරමින් සිටින බවත් ඒ සම්බන්ධයෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට විරුද්ධව දෙවැනි වරටත් අභියාචනයක් දින කිහිපයකට පෙර ඉදිරිපත් කර ඇති බවත් බොහෝ දෙනා නොදනිති. කරුණාරත්න මහතා බොහෝ දෑ සම්බන්ධයෙන් මෙන්ම මෙහිදී ද ප්‍රකාශ කරන්නේ හිතළු පමණය. කරුණාරත්න මහතා පේරාදෙණියෙන් නෙරපනු ලැබීමෙන් පසුවත් ඔහු උපදේශක පදවියකට පත් කළ විවෘත විශ්වවිද්‍යාලය මා ඒ තනතුරටත් පත් නොකිරීමට වග බලා ගත් බව ඒ මහතාට මතක් කර දිය යුත්තේ ඔහු කියන තරමටම විශ්වවිද්‍යාල පද්ධතිය ඔහු ප්‍රතික්ෂේප කර නොමැති බව දැන ගැනීමට සැලැස්වීමටය.) මාක්ස්වාදය යනු අවසාන විග්‍රහයේදී බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි ප්‍රධාන ආයුධය වන අතර බටහිර නූතනවාදී ධනවාදී පාලකයෝ ආසියාතික හා අප්‍රිකානු රටවල ජාතිකත්ව මොට කිරීම සඳහා වාසුදේව නානායක්කාර හා වික්‍රමබාහු කරුණාරත්න වැනි අය යොදා ගනිති. මාක්ස් කුමක් කීවද ඔහු කී දේ බොරු කරමින් දේශපාලනයෙහි ඇත්තේ ඊනියා පංති අරගලයක් නොව ජාතිකත්වය හා විජාතිකත්වය අතර සටනක් බව අද තහවුරු වී ඇත.

මාක්ස්වාදී පණ්ඩිතයන් කියන්නේ ජාතිය යන්න පාරභෞතික සංකල්පයක් බවත් පංතිය යන්න අද ඉතිහාසයේ ගාමක බලය බවත්ය. මේ පාරභෞතික කතාව බොහෝ පණ්ඩිතයන් යොදා ගන්නකි. පාරභෞතිකයක් ගැන කතා කළ හැක්කේ භෞතිකයක් තිබෙන්නේ නම් පමණකි. භෞතිකයක් නැති විටෙක පාරභෞතිකයක් ගැන කතා කිරීම විහිළුවකි. ජාතිය මෙන්ම පංතියද මම ආදී සංකල්පද මනසේ ම නිර්මාණ වෙයි. වෙනකක් තබා මනසද මනසෙහිම නිර්මාණයක් වෙයි. ජාතිය පාරභෞතික යැයි කියන්නෙ එය අස්පර්ශී (අතට හා වෙනත් ඉන්ද්‍රියනට හසු නොවන) බැවින් ද? එසේ නම් පංතිය ද අස්පර්ශී වෙයි. මෙහි දී වැදගත් වන්නේ අප නිර්මාණය කරන සංකල්ප හා ප්‍රවාද අනෙක් සංකල්ප හා ප්‍රවාද හා ඒ ආශ්‍රිත සාධක ආදිය සමග කෙතෙරම් දුරට සංගත වන්නේද යන්නය. පංතිය යනු අසංගත සංකල්පයක් වන අතර ජාතිය යන්න සංගත වෙයි. පංතිය යන්න සුරංගනා කතාවක් වැනි අසංගත හිතළුවක් පමණය. එය වැඩිම වුවහොත් අද දවසේ හොඳ විහිළුවක පමණකි. ජාතිකත්වය හා විජාතිකත්වය අතර සටනේ දී විජාතික මාක්ස්වාදීහු එලෙසම විජාතික වූ ආණ්ඩුව සමග එකට පෙළ ගැසෙති. අද මේ මාක්ස්වාදීන්ට පැවැත්මක් ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවලට හා ආණ්ඩුවෙ හා පෞද්ගලික ජනමාධ්‍යවලට පින් සිදු වන්නටය.

මේ විජාතික ආණ්ඩුව වෙනුවට ජනාධිපතිනිය විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියා නොකළහොත් රටට මෙන්ම ශ්‍රී. ල. නි පක්‍ෂයටද අනාගතයක් නැති වනු ඇත. ශ්‍රී. ල. නි. පක්‍ෂය එහි ඇතැම් නායකයන් කුමක් සිතාගෙන සිටියද 1955 න් පමණ පසුව මෙරට ජාතිකත්වයේ පක්‍ෂයයි. එයට ජාතිකත්වයෙන් තොර පැවැත්මක් නැත. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය 1992 දී පමණ විජාතික බලවේග හරහා මෙරටට ගෙන්වා අවසානයේදී ශ්‍රී ල නි පක්‍ෂයේ නායිකාව බවට පත්කෙරුණේ දෙමළ ජාතිවාදයේ අභිලාෂ ශ්‍රී. ල නි පක්‍ෂය ලවා ඉටු කර ගැනීමටය. පොදු පෙරමුණු ආණ්ඩුව තිබූ කාලයේදී එය ඉටු කර ගත නොහැකි වුවද අද වක්‍රව එය ඉටු කරවා ගැනීමට විජාතික බලවේග බලාපොරොත්තු වෙයි. ඒ විජාතික බලවේගවල සෘජු නියෝජිතයා වූ එ ජා පක්‍ෂය ප්‍රධාන ආණ්ඩුව දෙමළ ජාතිවාදයේ අභිලාෂ ඉටු කිරීමට පියවර ගන්නා විට කිසිවක් නොකර සිටීමට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට බල කර සිටීමෙනි. විජාතික බලවේගවල අවශ්‍යතාවය පරිදි කුමාරතුංග මහත්මිය කිසිවක් නොකර සිටීමේ ප්‍රතිඵලය වන්නේ කුමාරතුංග

© Prof. Nalin De Silva

මහත්මියගේ ජනාධිපතිධුර කාලය අවසන් වීමෙන් පසුව ඇය පරඬැලක් බවට පත්වීමය. ඒ සමග ශ්‍රී ල නි පක්‍ෂය ඉතා දුර්වල වනු ඇත. ශ්‍රී ල නි පක්‍ෂයට ඉන් පසු නැවතත් ජාතික නායකයකු යටතේ ජාතිකත්වය මත හිඳිමින් සංවිධානය වී පෙරට පැමිණිය හැකි නමුත් එයට බොහෝ කලක් ගත වෙයි.

ශ්‍රී ල නි පක්‍ෂයට මෙරට ඉතිහාසය විසින් උරුම කර දුන් ක්‍රියාවලියක් වෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය හා බොරු ලිබරලුන් හා බොරු මාක්ස්වාදීන් පිරිසක් පක්‍ෂයේ වැදගත් තනතුරුවලට පත්වීම නිසා ම පක්‍ෂයට උරුම වී ඇති කාර්යය නොකර සිටීමට හා එමගින් පක්‍ෂය දශක ගණනාවකින් ආපස්සට තල්ලු කිරීමට ඉඩදී බලා සිටීමට ශ්‍රී ල නි පාක්‍ෂිකයන්ට හැකිද? දේශපාලන පක්‍ෂ ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය නිසාම නායක නායිකාවන්ට අනවශ්‍ය බලතල අයත් වී ඇති නමුත් පක්‍ෂයේ හා රටේ අනාගතය වෙනුවෙන් ක්‍රියා මාර්ගයක් ගැනීමට ශ්‍රී ල නි පාක්‍ෂිකයන්ට අවස්ථාව පැමිණ ඇත. මේ අවස්ථාව මගහැරීම යනු සියතින් ගෙල වැලලා ගැනීමකි.

ශ්‍රී ල නි පක්‍ෂය යනු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නොවෙයි. ඒ මහත්මිය බණ්ඩාරනායක මහතාගේ හා මැතිනියගේ දියණිය වීම හැරෙන්නට ඇයට එහි නායකත්වයට පත් වීමට වෙනත් සුදුසු කමක් නැත. කුමාරතුංග මහත්මිය වැඩ කළ යුත්තේ ශ්‍රී ල නි පක්‍ෂයට ඡන්දය දෙන ලක්‍ෂ සංඛ්‍යාත ජනකායකගේ අවශ්‍යතාවය පරිදි මිස විජාතික බලවේගවල අවශ්‍යතාවය පරිදි නොවේ. ඒ බව වඩාත්ම තේරුම් ගත යුත්තෝ ශ්‍රී ල නි පාක්‍ෂිකයෝ වෙති. ශ්‍රී ල නි ප තීරණයක් ගත යුතුව ඇත. මේ නිවට ආණ්ඩුවට රට පාවා දීමට ඉඩ දීමට ඉඩ දී බලා සිටින්නේ ද? එමගින් රටත් ජාතියත් පක්‍ෂයත් නැති කර ගන්නේද? නැත්නම් විජාතික බලවේගවලට අභියෝග කරමින් පෙරට ගොස් ජාතිය රැක ගන්නේද?

පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනා ගෙන ඒමෙන් පමණක් කළ හැකි දෙයක් නැත. අද අවශ්‍ය වන්නේ හැන්සාඩ් පිටු පිරවීම පමණක් නොවේ. පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග සමග ජනතාවද ඒකාබද්ධ කර ගන්නා වැඩපිළිවෙළක් ගැන සිතා බැලිය යුතුය. එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. එහෙත් ඒ ක්‍රියාමාර්ග රටේ ප්‍රධාන ප්‍රශ්නය වූ රට බෙදීම අමතක කර හැළිවළං උස්සා ගෙන කරන බොරු ඝෝෂා විය යුතු නොවේ. අද කළ යුත්ත හෙටට කල් දැමීම යනු දේශපාලනයේ දී සිය දිවි නසා ගැනීමක් වෙයි. ශ්‍රී ල නි පක්‍ෂයට එක්කෝ රට ජාතිය රැකිය හැකිය. නැත්නම් රටත් ජාතියත් නැති කරමින් දිය වී යා හැකිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva